සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මேல் மாகாணக் கல்வித் திணைக்களம் Department of Education - Western Province

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**மேல் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department of Education - Western Province**

# පළමුවාර අවසාන ඇගයීම
# First term End Evaluation - 2018

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 09 | විෂයය / பாடம் / Subject: ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper: I,II | කාලය / காலம் / Time: පැය 02යි. |

නම :- ........................................................................................ විභාග අංකය :- ...........................

සැලකිය යුතුයි:

* I කොටසේ ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම ලියන්න.

* II කොටසට අදාළ පිළිතුරු වෙනම කඩදාසියක ලියා පළමු කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.

## I කොටස

❖ අංක 01 සිට 20 දක්වා ප්‍රශ්නවලට වඩාත් සුදුසු පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(01) ඉන්දියානු සාගරයේ වෙළඳ බලය ගොඩ නගා ගැනීමට ලන්දේසීන් තම වෙළෙඳ මූලස්ථානය පිහිටුවා ගත්තේ කුමන ස්ථානයක ද?

(1) බතාවිය (2) ගෝව (3) මදුරාසිය (4) කල්කටාව

(02) කුණ්ඩසාලේ කුමාරයා ලෙස ප්‍රසිද්ධියට පත්වූ උඩරට පාලකයා වන්නේ,

(1) දෙවන විමලධර්මසූරිය රජු ය. (2) ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු ය.
(3) දෙවන රාජසිංහ රජු ය. (4) පළමුවන විමලධර්මසූරිය රජු ය.

(03) ක්‍රි.ව. 1766 දී ලන්දේසීන්ට වාසි සහගත කොන්දේසි මාලාවක් ඉදිරිපත් කොට උඩරට පාලකයා සමඟ ගිවිසුමකට එළඹී ආණ්ඩුකාරවරයා වන්නේ,

(1) බැරන් වැන් එක් ය. (2) විලෙම් පැලක් ය.
(3) ෆන් එංගල් බෙක් ය. (4) ජෙරාඩ් හල්ෆ්ට් ය.

(04) ක්‍රි. ව. 1762 දී කීර්ති ශ්‍රී රාජසිංහ රජු හමුවට පැමිණි ඉංග්‍රීසි ජාතිකයා වූයේ,

(1) ජොරිස් වැන් ස්පිල්බර්ජන් ය. (2) කලන් අල්බස් ය.
(3) ජෝන් පයිබස් ය. (4) ජෝන් ඩොයිලි ය.

(05) ලන්දේසි පාලනය නිසා ලාංකීය සමාජයට හා සංස්කෘතියට සිදු වූ බලපෑමක් නොවන්නේ මින් කුමක් ද?

(1) උසාවි ක්‍රමය හඳුන්වා දීම
(2) රෙපරමාදු ආගම මෙරට ස්ථාපිත වීම
(3) කුලුණු හා උස් වහල යොදා නිවාස ඉදිකිරීම
(4) බයිලා කපිරිඤ්ඤා සංගීතය මෙරට කලාවට එක්වීම

(06) පෘතුගීසින් මෙරටින් පළවා හැරීමේ දී දෙවන රාජසිංහ රජු හා ලන්දේසීන් අතර මත ගැටුම් ඇතිවීමට බලපෑ ප්‍රධාන හේතුවක් වන්නේ,

(1) පෘතුගීසින් යටතේ පැවැති ප්‍රදේශ රැසක් උඩරටට ඈඳා ගැනීම ය.
(2) කොළඹ කොටුව වඩා ශක්තිමත් කර තම මූලස්ථානය බවට පත්කර ගැනීම ය.
(3) ලන්දේසීන් තමන්ට වාසිදායක ප්‍රදේශවල බලකොටු අල්ලාගත් පසු 1638 ගිවිසුම පරිදි රජුට භාර නොදීම ය.
(4) බලකොටුවල සිටින සේවකයන්ට වැටුප් ගෙවීම රජු ප්‍රතික්ෂේප කිරීම ය.

(07) ලන්දේසීන් තමන් යටතේ පැවති ප්‍රදේශවලින් උපරිම ආර්ථික වාසි ලබාගැනීමේ අරමුණෙන් වගාකළ බෝග වර්ගය මින් කුමක් ද?

(1) කුරුඳු (2) කෝපි (3) තේ (4) රබර්

(08) ශ්‍රී ලංකාවේ වෙරළබඩ ප්‍රදේශවල ක්‍රි.ව. 1798 - 1802 අතර කාලයේ පැවති පාලන ක්‍රමය හඳුන්වන්නේ කුමන නමකින් ද?

(1) මදුරාසි පාලනය (2) ද්විත්ව පාලනය

(3) කිරීටයේ පාලනය (4) වෙළඳ සමාගමේ පාලනය

(09) ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල පළමු බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා වන්නේ,

(1) රොබට් බ්‍රවුන්රිග් ය. (2) තෝමස් මෙට්ලන්ඩ් ය.

(3) ටොරින්ටන් සාමි ය. (4) ෆෙඩ්රික් නෝර්ත් ය.

(10) ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ ක්‍රියාකලාපයට විරුද්ධව සබරගමුවේ කැරැල්ලක් ඇති කළ මහාධිකාරම්වරයාගේ නම මින් කුමක් ද?

(1) ඇහැලේපොළ මහාධිකාරම් (2) පිළිමතලව්වේ මහාධිකාරම්

(3) මොල්ලිගොඩ අදිකාරම් (4) කැප්පෙටිපොළ අධිකාරම්

(11) උඩරට ගිවිසුම අත්සන් කිරීමට පෙර ඉංග්‍රීසි කොඩිය එසවීමට විරුද්ධව කටයුතු කළ භික්ෂූන් වහන්සේ කවුරුන් ද?

(1) කඩහපොළ හිමියන් ය. (2) හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමියන් ය.

(3) වාරියපොළ ශ්‍රී සුමංගල හිමියන් ය. (4) පරණාතල හිමියන් ය.

(12) ක්‍රි. ව. 1803 වර්ෂයේ දි මහනුවර නගරය අල්ලාගත් ඉංග්‍රීසීන් උඩරට රජු ලෙස ප්‍රකාශයට පත්කරන ලද කුමරු වූයේ,

(1) මුත්තුසාමි කුමරු ය. (2) කන්නසාමි කුමරු ය.

(3) මහා අස්ථාන කුමරු ය. (4) ටිකිරි කුමරු ය.

(13) ක්‍රි. ව. 1803 නිදහස් සටනට හේතු වූ බදු පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) බලු බද්ද / ලුණු බද්ද (2) බලු බද්ද / තුවක්කු බද්ද

(3) ඇග බද්ද / දුම්කොළ බද්ද (4) මුද්දර බද්ද / මාළු බද්ද

(14) ක්‍රි. ව. 1848 දී "ශ්‍රී වික්‍රම සර්වසිද්ධි" නමින් දඹුල්ලේ දී ඔටුන පැළඳි නායකයා කවුරුන් ද?

(1) වීරපුරන් අප්පු (2) දොරේසාමි

(3) මඩුගල්ලේ දිසාව (4) ගොංගාලේ ගොඩබණ්ඩා

(15) ක්විනින් නැමති ඖෂධය නිපදවීම සඳහා මෙරට වගා කළ බෝගය කුමක් ද?

(1) කොකෝවා (2) කෝපි (3) කුරුඳු (4) සිංකෝනා

(16) පොල් වගාවේ දියුණුව සඳහා මෙන්ම පර්යේෂණ පැවැත්වීම සඳහා පොල් පර්යේෂණ ආයතනයක් පිහිටුවා ඇති ස්ථානය පහත පිළිතුරු අතරින් තෝරන්න.

(1) ලුණුවිල (2) තලවකැලේ (3) පේරාදෙණිය (4) ගන්නෝරුව

(17) මෙරට කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ දියුණුව උදෙසා වාරිමාර්ග දෙපාර්තමේන්තුව ආරම්භ කරන ලද්දේ කිනම් ආණ්ඩුකාරවරයා ද?

(1) මැකලම් (2) විලියම් ග්‍රෙගරි (3) වෙස්ට් රිජ්වේ (4) හෙන්රි වෝඩ්

(18) ක්‍රි. ව. 1848 නිදහස් අරගලය පැවති සමයේ මෙරට සිටි ආණ්ඩුකාරවරයා කවුරුන් ද?

(1) තෝමස් මෙට්ලන්ඩ් (2) ටොරින්ටන් සාමි
(3) රොබට් බ්‍රවුන්රිග් (4) ආතර් ගෝඩ්න්

(19) ක්‍රි. ව. 1818 හා 1848 නිදහස් සටන් ආරම්භ වූ ප්‍රදේශ පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) දුම්බර - මාතලේ (2) වෙල්ලස්ස - මාතලේ
(3) මාතලේ - කුරුණෑගල (4) වෙල්ලස්ස - වාරියපොළ

(20) දේශීය කෘෂිකර්මාන්තය දියුණු කිරීමට වියලි කලාපයේ ගොවි ජනපද පිහිටුවීමේ ව්‍යාපාරයක් ආරම්භ කරනු ලැබූ පුද්ගලයා කවු ද?

(1) ඩී.ඇස්.සේනානායක මහතා (2) මැකලම් ආණ්ඩුකාරවරයා
(3) හර්කියුලස් රොබින්සන් ආණ්ඩුකාරවරයා (4) ජේ. ආර්. ජයවර්ධන මහතා

(ලකුණු 2 x 20 = 40

## II කොටස

*** පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.**
*** අනිකුත් ප්‍රශ්න අතරින් හතරකට පිළිතුරු සපයන්න.**
*** පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.**

(01) පහත A සහ B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කර අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අංක අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

A



(අ) 1. මෙම රූපයෙන් දැක්වෙන රජතුමා කවුරුන් ද?
2. මෙතුමා රජ කළ රාජධානි යුගය නම් කරන්න.
3. මෙතුමා රජවීමට පෙර භාවිතා කළ නම කුමක් ද?
4. මෙම රජතුමාගෙන් සිදුවූ සේවාවක් සඳහන් කරන්න.

B



(ආ) 1. මෙම රූපයෙන් දැක්වෙන්නේ කුමක් ද?
2. මෙය පිහිටා ඇති නගරය කුමක් ද?
3. මෙම ස්ථානයේ දී අත්සන් කල ඓතිහාසික ලියවිල්ල කුමක් ද?
4. වර්තමානයේ මෙයට යාබදව ඇති පූජනීය ස්ථානය කුමක් ද? (ලකුණු 2 x 8 = 16)

(02) (i) උඩරට රාජ්‍ය සමඟ සබඳතා පැවැත්වූ ලන්දේසි දූතයන් දෙදෙනෙක් නම් කරන්න. (ලකුණු 02)

(ii) ලන්දේසීන් සමඟ අත්සන් කළ ක්‍රි. ව. 1638 ගිවිසුමේ කොන්දේසි දෙකක් ලියන්න. (ලකුණු 04)

(iii) ක්‍රි. ව. 1638 ගිවිසුමට අනුව කටයුතු කිරීමේ දී ලන්දේසීන් මුල සිට ම අතිශය කපටි අන්දමින් කටයුතු කර ඇති බව උදාහරණ දෙකක් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(03) (i) පහත සඳහන් ප්‍රකාශවලට අදාළ පිළිතුරු පිළිවෙළින් ලියන්න.

A. ලන්දේසීන් ආගම් ප්‍රචාරය කිරීම සඳහා ආරම්භ කළ ආයතන විශේෂය

B. ලන්දේසි පාලනය නිසා මෙරට ජන සමාජයට එක් වූ ජන වර්ගය (ලකුණු 02)

(ii) ලන්දේසීන් බදු අය කිරීම සඳහා සකස් කළ ලේඛන වර්ග (තෝම්බු) දෙකක් සඳහන් කොට ඒවා අය කළේ කුමන කටයුතු සඳහා දැයි ලියන්න. (ලකුණු 04)

(iii) මෙරට පරිභරණයට හෝ වෙළඳාමට යොදාගත හැකි දේ නිපදවීමෙන් අමතර ආදායම් ලබා ගැනීම පිණිස ලන්දේසීන් කටයුතු කළ ආකාරය කරුණු දෙකක් යටතේ පැහැදිලි කරන්න. (ලකුණු 05)

(04) (i) බ්‍රිතාන්‍යන්ගේ අවධානය ශ්‍රී ලංකාව කෙරෙහි යොමුවීමට බලපෑ හේතු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) ක්‍රි. ව. 1787 වර්ෂයේ දී මුහුදුබඩ ප්‍රදේශ වල ඇතිවූ කැරැල්ල සඳහා බලපෑ හේතු දෙකක් ලියන්න. (ලකුණු 04)

(iii) ක්‍රි. ව. 1803 ඉංග්‍රීසින්ගේ පළමු උඩරට ආක්‍රමණය මෙහෙවූ සෙන්පතියාගේ නම සඳහන් කොට එය අසාර්ථක වීමට බලපෑ හේතු දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(05) (i) ඉංග්‍රීසීන් උඩරට රාජ්‍ය යටත් කර ගැනීම කෙරෙහි අවධානය යොමු කිරීමට බලපෑ හේතු දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) උඩරට රාජ්‍ය යටත් කර ගැනීමට උපායශීලී ප්‍රතිපත්තියක් අනුගමනය කළ

A - ආණ්ඩුකාරවරයා

B - ඒ සඳහා යොදාගත් නිළධාරියා නම් කරන්න. (ලකුණු 04)

(iii) ක්‍රි. ව. 1815 උඩරට රාජධානිය බිඳ වැටීමට බලපෑ අභ්‍යන්තර බල අරගලය කරුණු දෙකක් යටතේ කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(06) (i) ක්‍රි. ව. 1818 සටනට තුඩුදුන් හේතු දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) ක්‍රි. ව. 1818 නිදහස් සටන අසාර්ථක වීමට බලපෑ හේතු හතරක් ලියන්න. (ලකුණු 04)

(iii) ක්‍රි. ව. 1848 නිදහස් සටනට කෝල්බෲක් ප්‍රතිසංස්කරණ බලපෑ ආකාරය කරුණු දෙකක් යටතේ කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(07) (i) පහත A හා B යටතේ ඇති සිදුවීම්වලට සම්බන්ධ පුද්ගලයන් පිළිවෙළින් ලියන්න.

A. මෙරට ප්‍රථමවරට කෝපි වත්තක් ආරම්භ කිරීම

B. මෙරට තේ වගාව පිළිබඳ අත්හදා බැලීම් සිදු කිරීම (ලකුණු 02)

(ii) මෙරට තේ වගාවේ දියුණුවට බලපෑ සාධක දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) බ්‍රිතාන්‍යයන් දේශීය කෘෂි කර්මාන්තය නගා සිටුවීමට ගත් ක්‍රියාමාර්ග දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)